2009 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ
පාලන වාර්තාව

1. **හැඳින්වීම:**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුවට, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණු විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමූහික වගකීමද, 2006 අංක 27 දරණ දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද, දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙලේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට සැලකිය යුතු අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සැම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

2. **ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාවේ, නීත්‍යානුකුල නොවන මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් ගොඩනැගීමට දායක වීම.

3. **මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකුල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙන්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

පරමාර්ථයන් :

අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.
ඈ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

ක්‍රියාකාරකම් :

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඈ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම
ඉ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම

4. සංවිධාන ව්‍යුහය

2009.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ)	:	01
සුරාබදු කොමසාරිස් (ආදායම්) (ශ්‍රී.ලං.ප.සේ)	:	01
සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්) (ශ්‍රී.ලං.ප.සේ)	:	01
සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ)	:	01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ)	:	01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ)	:	01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යයන්තර විගණන) (ශ්‍රී.ලං.ග.සේ)	:	01
සහකාර සුරාබදු කොමසාරිස්	:	12
පරිපාලන නිලධාරී	:	02
සුරාබදු අධිකාරී	:	14
ප්‍රධාන සුරාබදු පරීක්ෂක	:	24
සුරාබදු පරීක්ෂක	:	271
සුරාබදු සැරයන් මේජර්	:	14
සුරාබදු සැරයන්	:	67
සුරාබදු නියාමක / කෝප්‍රල්	:	432
සුරාබදු රියදුරු	:	58
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	:	88
අයවැය සහකාර	:	01
කාර්යාල සේවක සේවය	:	38
බංගලා භාරකරු	:	03

5. මාණ්ඩලික වෙනස්කම්:

- ශ්‍රී.ලං.ග.සේ I, කේ.ඩී.ජේ ද ලසාල් මහතා 2009.05.11 වන දින සිට ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ I ඩී.එම්.වී දිසානායක මෙනවිය ස්ථාන මාරු ලැබ පැමිණියාය.
- ශ්‍රී.ලං.ග.සේ II/I එස්.ඩී ශ්‍රියාලතා මහත්මිය ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ II/II ජ්.ඒ. අජිත් ප්‍රියන්ත මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.
- ශ්‍රී.ලං.ප.සේ III, එම්.එම් විජයසේන මහතා 2009.02.17 වන දින සිට ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ප.සේ III, ඩබ්. විතානගේ මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.
- ශ්‍රී.ලං.ග.සේ 1, සී. ජයරත්න මහතා 2009.07.01 වන දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රම ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ II/I ඒ.එන් හපුගල මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.
- පරිපාලන නිලධාරී යූ.එච්.එන්.පී උණගල්ල මහතා 2009.10.22 වන දින සිට ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.
- 2009 වර්ෂය තුළදී පහත නම් සඳහන් නිලධාරීන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී

නිලධාරියාගේ නම	තනතුර	විශ්‍රාම ගත් දිනය
ජ්.කේ.එම්.ජ් බණ්ඩාර මහතා	සුරාබදු පරීක්ෂක	2009.06.19
කේ. රාමචන්ද්‍රන් මහතා	සුරාබදු පරීක්ෂක	2009.12.16

- සුරාබදු පරීක්ෂක, එන්. ශ්‍රීකාන්තන් මහතා 2009.03.27 වන දින, හදිසි අනතුරකින් මියයන ලදී.

6. **මානව සම්පත් සංවර්ධනය:**

සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්) යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙකු, සුරාබදු පරීක්ෂකවරයෙකු, සුරාබදු නියාමකවරයෙකු, කාන්තා සුරාබදු නියාමකවරියක් සහ සුරාබදු රියදුරෙකු අනුයුක්ත කර ඇත.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම සහ ආකල්ප සංවර්ධනය අරමුණු කොට ගෙන, විවිධ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම, සහ විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් යොමු කිරීම මෙම ඒකකයේ මූලික කාර්යභාරය වේ.

සංවිධානය කල පාඨමාලා:

	පාඨමාලාව	කාල සීමාව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ ආයතනය
1	සුරාබදු නියාමක පුහුණුව	2009.02.18 - 2009.02.20	68	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය
2	සහකාර සුරාබදු කොමසාරිස් පුහුණුව	2009.06.01 - 2009.06.05	17	-එම-
3	රාජ්‍ය කළමනාකාරණ සේවා පුහුණුව	2009.06.04 - 2009.06.05	37	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
4	සුරාබදු ස්ථානාධිපති පුහුණුව	2009.06.09	44	ශ්‍රී ලංකා පදනම් ආයතනය
5	සුරාබදු පරීක්ෂ පුහුණුව	2009.06.22 - 2009.06.26	38	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
6	සහකාර සුරාබදු කොමසාරිස් / සුරාබදු අධිකාරී පුහුණුව	2009.07.13 - 2009.07.17	17	අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය
7	සුරාබදු පරීක්ෂක පුහුණුව	2009.07.20 - 2009.07.24	31	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
8	සුරාබදු සැරයන් මේජර්/සුරාබදු සැරයන්/කාන්තා සුරාබදු නිලධාරීන්	2009.07.27 - 2009.07.31	60	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය / අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
9	සුරාබදු පරීක්ෂ පුහුණුව (ද්‍රවිඩ භාෂාව)	2009.08.07 - 2009.08.09	78	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
10	සහකාර සුරාබදු කොමසාරිස් / සුරාබදු අධිකාරී පුහුණුව	2009.08.10 - 2009.08.14	15	අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය
11	සුරාබදු පරීක්ෂක පුහුණුව	2009.08.10 - 2009.08.14	47	- එම -
12	සුරාබදු නියාමක පුහුණුව	2009.08.17 - 2009.08.21	35	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
13	සුරාබදු පරීක්ෂකයන් සඳහා පරිඝණක පුහුණුව	2009.09.07 - 2009.09.09	19	සුරාබදු පරිඝණකාගාරය
14	සුරාබදු පරීක්ෂකයන් සඳහා පරිඝණක පුහුණුව	2009.09.10 - 2009.09.12	19	සුරාබදු පරිඝණකාගාරය

15	සුරාබදු නියාමක පුහුණුව	2009.09.14	2009.09.18	88	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය / අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
16	සුරාබදු පරීක්ෂකයන් සඳහා පරිසණක පුහුණුව	2009.09.28	2009.09.30	15	සුරාබදු පරිසණකාගාරය
17	සුරාබදු නියාමක පුහුණුව	2009.10.05	2009.10.09	31	සුරාබදු පුහුණු පාසැල, පනාදරගම
18	සුරාබදු පරීක්ෂක පුහුණුව	2009.10.12	2009.10.16	54	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය
19	සුරාබදු නියාමක පුහුණුව	2009.10.19	2009.10.23	46	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය / අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
20	සුරාබදු නියාමකයන් සඳහා පරිසණක පුහුණුව	2009.10.26	2009.10.28	15	සුරාබදු පරිසණකාගාරය
21	සුරාබදු නියාමකයන් සඳහා පරිසණක පුහුණුව	2009.10.29	2009.10.31	14	සුරාබදු පරිසණකාගාරය
22	සුරාබදු පරීක්ෂක පුහුණුව	2009.11.02	2009.11.06	29	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
23	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පරිසණක පුහුණුව	2009.11.04	2009.11.10	13	සුරාබදු පරිසණකාගාරය
24	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පරිසණක පුහුණුව	2009.11.11	2009.11.25	15	සුරාබදු පුහුණු පාසැල - පනාදරගම
25	සුරාබදු නියාමකයන් සඳහා පරිසණක පුහුණුව	2009.11.12	2009.11.14	20	සුරාබදු පරිසණකාගාරය
26	සහකාර සුරාබදු කෙමසාරිස් / සුරාබදු අධිකාරී පුහුණුව	2009.11.16	2009.11.20	17	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය
27	සුරාබදු නියාමකයන් සඳහා පරිසණක පුහුණුව	2009.11.23	2009.11.25	20	සුරාබදු පරිසණකාගාරය
28	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පුහුණුව	2009.12.02		08	සුරාබදු ප්‍රධාන කාර්යාලය
29	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පුහුණුව	2009.12.03		07	බන්ධනාගාර දෙපාර්තමේන්තුව
30	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පුහුණුව	2009.12.04		06	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
31	නවක සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පුහුණුව	2009.12.07	2009.12.11	13	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය / අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
32	සුරාබදු නියාමක පුහුණුව	2009.12.07	2009.12.11	33	රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය

මෙයට අමතරව,

01. ප්‍රාදේශීය සුරාබදු ඒකකයන්හි නීතිමය ගැටළු සඳහා සහයවීම, නීතිපති දෙපාර්මේන්තුවේ සහය ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම,

02. දෙපාර්තමේන්තු චක්‍ර ලේඛණ නිකුත් කිරීමේ/කාර්ය සාධන හඳුන්වා දීමේ කටයුතු සහ ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කිරීම සහ සම්බන්ධීකරණය

7. යටිතල සංවර්ධනය (ගොඩනැගිලි)

අ. (බාහිර ප්‍රදේශ)

කාර්යාලය	කාර්ය ස්වභාවය	වියදම (රුපියල්)
පොලොන්නරුව සංචාරක බංගලාව	ජනේල සඳහා යකඩ ග්‍රිල් සවි කිරීම	133,200.00
අනුරාධපුරය සංචාරක බංගලාව	අළුත්වැඩියා කටයුතු	1,397,375.74
සුරාබදු සංකීර්ණය (දකුණු පළාත)	නාම පුවරු සැකසීම	73,000.00
- එම -	ජල පහසුකම් ලබා ගැනීම	34,930.29
- එම -	විදුලිය පහසුකම් ලබා ගැනීම	21,126.00
සුරාබදු ස්ථානය - අම්පාර	- එම -	296,524.45
සුරාබදු අධිකාරී කාර්යාලය - මාතලේ	- එම -	10,200.00
සුරාබදු ස්ථානය - කැබිතිගොල්ලෑව (දැනට ඉදිවෙමින් පවතින)	ඉඩම වටා වැට ගැසීම	125,824.50
සුරාබදු ස්ථානය - පොලොන්නරුව	ගරාජයක් ඉදි කිරීම	146,321.80
-එම-	අළුත්වැඩියා කටයුතු	126,278.00
සුරාබදු සංකීර්ණය - ඌව පළාත	කාර්යාල භූමිය වටා තාප්පයක් ඉදි කිරීම	214,226.00
-එම-	ගෙබිම ටයිල් කිරීම	1,001,560.00
-එම-	වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම	161,763.37
සුරාබදු ස්ථානය - ඇල්පිටිය	ජල පහසුකම් ලබා ගැනීම	40,642.44
- එම -	විදුලිය පහසුකම් ලබා ගැනීම	62,590.00
සුරාබදු ස්ථානය - මාදම්පේ	නළ ළිඳක් ඉදි කිරීම	10,000.00
සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය (උතුරු මැද)	කාර්යාලීය අළුත්වැඩියා කටයුතු	641,000.00
සුරාබදු ස්ථානය - මඩකලපුව	කාර්යාල භූමිය වටා තාප්පයක් ඉදි කිරීම	300,000.00
සුරාබදු ස්ථානය - කැස්බෑව	නළ ළිඳට මෝටරයක් සවි කිරීම	34,000.00
සුරාබදු සංකීර්ණය - වයඹ පළාත	ජල පහසුකම් ලබා ගැනීම	28,188.60
සුරාබදු අධිකාරී - පොලොන්නරුව	නවාතැන් පහසුකම් සැපයීම	199,624.30

ආ. (ප්‍රධාන කාර්යාලය - කොළඹ 2)

කාර්යාලය	කාර්ය ස්වභාවය	වියදම (රුපියල්)
ගබඩාව	දැල් ගැසීම	141,350.00
ප්‍රධාන කාර්යාල සංකීර්ණය	විවිධ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කල ගෙවීම්	200,000.00

ඇ. 2009 වර්ෂය තුලදී පහත සඳහන් වාහන මිලට ගන්නා ලදී.

වාහන අංකය	වර්ගය	මිල - රුපියල්
PB 8272	ඉසුසු ක්‍යෑ කැබ්	4,368,000.00
PB 8273	ඉසුසු ක්‍යෑ කැබ්	4,368,000.00

මීට අමතරව, රේගු දෙපාර්තමේන්තුවෙන් රාජ සන්තක කරන ලද පහත සඳහන් වාහන දෙක, මෙම දෙපාර්තමේන්තුවට ලබා ගන්නා ලදී.

- KI 1772 ටොයෝටා ඩබල් කැබ් රථය
- PB 8478 වැනට් වෑන් රථය

8. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

වර්තමාන සුරාබදු ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව සකස් වී ඇත. ඒ අනුව, මත්පැන් හා දුම්වැටි භාවිතය පාලනය සඳහා අවශ්‍ය කටයුතු, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මත්පැන් පරිභෝජනය අධෛර්යමත් කිරීමේ පියවරක් වශයෙන්, මත්පැන් සඳහා අය කරනු බදු නිතිපතා වැඩි කරනු ලැබී ය. එසේම, නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම, සංචාරක මණ්ඩලය අනුමත කරනු ලබන හෝටල්වලට පමණක් සීමා කර ඇත.

වගුව 8.1

වර්ෂය	සැර මත්පැන්		බියර්	
	ප්‍රමාණය සම්මත සැර ලීටර මිලියන	වර්ධන ප්‍රතිශතය %	ප්‍රමාණය ලීටර මිලියන	වර්ධන ප්‍රතිශතය %
2003	32.0	-	47.8	-
2004	34.5	8	48.3	1
2005	38.5	11	51.5	6
2006	45.4	18	46.9	-9
2007	47.2	4	49.7	6
2008	45.7	-2	57.3	15
2009	41.1	-10	55.5	-3

සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම්, පනත් සහ ආඥා පනත් ක්‍රියාත්මක කිරීමේ දී, උසාවි දඩ වශයෙන් එකතු කරන මුදල්, මුළු ආදායම හා සැසඳීමේ දී සුළු ප්‍රතිශතයක් වන අතර, එම ආදායම් බැර වනුයේ අදාල පළාත් සභා අරමුදල්වලට ය. එකී ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය දක්වා ඇත.

වගුව 8.2

වර්ෂය	බලපත්‍ර ගාස්තු (රු. මිලියන)	දඩ මුදල් (රු.මිලියන)	එකතුව (රු.මිලියන)
2003	177	75	252
2004	212	79	291
2005	231	91	322
2006	355	176	531
2007	357	269	626
2008	379	244	623
2009	384	196	580

දෙපාර්තමේන්තුව විසින් දේශීය කර්මාන්ත සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී, ලීටරයකට රු. 200/- ක බද්දක් ද, විදේශීය නිශ්පාදන සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී ලීටරයකට රු. 100/- ක බද්දක් ද අය කරනු ලැබී ය. ඒ අනුව ස්ප්‍රීතු නිකුත් කිරීම්වලදී බදු වශයෙන් 2009 වර්ෂයේ දී උපයා ඇති ආදායම රුපියල් මිලියන 468 කි.

සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේ දී නිකුත් කරනු ලබන අයදුම් පත්‍රයක් සඳහා රු. 7500/- ක මුදලක් අය කරනු ලබයි. බලපත්‍ර ස්ථානයක් ස්ථාන මාරු කිරීමේ දී රු. 100,000/- ක මුදලක් අය කරනු ලැබේ. තවද, බලපත්‍රයක් වෙනත් පුද්ගලයෙකුට පැවරීමේ දී, ර.බි 04 බලපත්‍රයක් සම්බන්ධයෙන් රු. 500,000/- ක මුදලක් ද, අනෙකුත් බලපත්‍ර සම්බන්ධයෙන් රු. 150,000/- ක මුදලක් ද අය කරනු ලැබේ. මෙසේ 2009 වර්ෂයේ දී එකතු කර ගත් මුළු ආදායම රුපියල් මිලියන 114.0 කි.

9. සුරාබදු ව්‍යුහය:

වගුව : 9.1

විස්තරය	ඒකකය	2008.10.07 වන දිනට	2009.03.27 වන දිනට
ඉක්ෂුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කල අරක්කු සම්මත ලීටරයකට	සම්මත ලීටර	560/=	610/=
විදේශීය මත්පැන් සම්මත ලීටරයකට	සම්මත ලීටර	690/=	740/=
මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට	තොග ලීටර	48/=	48/=
මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට	තොග ලීටර	64/=	64/=
වයින් ලීටරයක් සඳහා	ලීටර	415/=	465/=
දුම්කොළ මත සුරා බද්ද කි.ග්‍රෑ එකකට	කි.ග්‍රෑ.01 කට	10/=	10/=
බෝතල් රා	ලීටර 01 කට	10/=	10/=

විස්තරය	ඒකකය	2003.11.20 (ආරම්භය)	2007.12.04
පරිපාක ස්ප්‍රීතු - කාර්මික නිශ්පාදන අපනයන කටයුතු	තොග ලීටර	-	100/=
පරිපාක ස්ප්‍රීතු - කාර්මික නිශ්පාදන දේශීය වෙළඳපොළ	තොග ලීටර	200/=	200/=

මෑත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය:

වර්ෂය	ආදායම (රු. මිලියන)	වියදම (රු. මිලියන)	ප්‍රතිශතයක් වශයෙන්
2001	6,245.471	148.097	2.37
2002	8,541.628	151.395	1.77
2003	10,719.444	146.415	1.37
2004	13,545.502	173.000	1.28
2005	16,117.555	211.933	1.31
2006	20,694.008	297.000	1.44
2007	23,755.648	367.580	1.54
2008	27,436.152	372.023	1.35
2009	28,536.727	418.700	1.46

* සුරාබද්ද වැඩි කිරීම නිසා ආදායම වැඩි වී ඇත.

10. **අභ්‍යන්තර විගණන ඒකකය :**

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පාලනය වන මෙම ඒකකය, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකු සහ රාජ්‍ය කළමනාකරණ සේවයයේ නිලධාරීන් දෙදෙනකුගෙන් යුක්තව ක්‍රියාත්මක වේ. වර්ෂය තුල ක්‍රියාත්මක වන සුරාබදු දෙපාර්තමේන්තු ආයතනික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා:-

- සුරාබදු ආඥා පණත යටතේ ආදායම් එකතු කිරීම
- මානව සම්පත් සංවර්ධනය
- තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම

- දුම්කොළ බදු පණත ක්‍රියාත්මක කිරීම
- මූල්‍ය කළමනාකරණය
- වාහන හා අනෙකුත් වත්කම් කළමනාකරණය

යන ක්ෂේත්‍රයන් ඔස්සේ විමර්ෂණ කටයුතු මූලික වශයෙන් ක්‍රියාවට නංවනු ලබයි. එකී ක්ෂේත්‍ර යාකරමින් සුරාබදු ප්‍රධාන කාර්යාලයට අදාලව ලැබීම්, ගෙවීම්, සැපයුම්, සේවා සහ වත්කම් කළමණාකරනය විගණනය කිරීම අරමුනු කරගනිමින් සියළු ලැබීම්, සැපයීම්, ගෙවීම් වවුචර් පත් විගණනයට භාජනය කිරීම සහ වාහන 105 කට අදාල පිරිවැය ලේඛණ පරීක්ෂා කිරීම කරන ලද අතර ප්‍රදේශීය කාර්යාල විගණන වැඩසටහන යටතේ 2009 වර්ෂය තුලදී සුරාබදු ස්ථාන, සුරාබදු අධිකාරී කාර්යාල, සුරාබදු සහකාර කොමසාරිස් කාර්යාල, නිෂ්පාදනාගාර, ස්කාගාර, ගුදම් හා රා නිෂ්පාදනාගාර ඇතුළු උප කාර්යාල 14 ක් විගණනයට ලක් කරන ලදී.

මෙමගින් අදාල අණපනත්, සුරාබදු නිවේදන, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය මගින් නිකුත් කර ඇති උපදෙස් වලට අනුකුල නොවූ තත්ත්වයන් හඳුනා ගෙන ඊට අවශ්‍ය පිලියම් හා එබඳු අවස්ථා මගහරවා ගැනීමට අවශ්‍ය උපක්‍රම හා ක්‍රමවේද යන්ද හඳුන්වාදෙන ලදී. එම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස සුරාබදු උපකාර්යාල වලින් රැස්කරන ආදායම් ගිණුම් ගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් හා කාර්යක්ෂම කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය දායක වීමට 2009 වසරතුලදී හැකියාව ලැබුනි. තවද අක්‍රමවත්ව පැවැති වාහන පිරිවැය ලේඛණය ක්‍රමවත් ව පවත්වා ගෙන යැමට අවශ්‍ය උපක්‍රම හා උපදෙස් සැපයීම තුලින් කාර්යක්ෂම දෙපාර්තමේන්තු සේවයක් ලබාදීම සඳහා දායක වීමටද අභ්‍යන්තර විගණන අංශයට අවස්ථාව සැලසුනි.

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් 2009 වර්ෂයේ දී පවත්වා ඇති අතර එමගින් අමාත්‍යාංශ විගණන හා කළමණනාකරන කමිටු රැස්වීම් වල දී ගන්නා තිරණ සියළු මාණ්ඩලික නිලධාරීන් හරහා ක්‍රියාත්මක කිරීමටත්, විගණකාධිපති හා අභ්‍යන්තර විගණන විමසුම් වලින් පැන නගින නිරීක්ෂණයන් ඇතුළු සම්පත් කළමනාකරණයේ දී මතුවන ගැටළු සාකච්ජාවටත් භාජනය කරන ලදී.

මේ සියලු වැඩසටහන් තුලින් ආයතනයේ ඉලක්ක හා අරමුණු කරා ලඟාවීමට සාර්ථක පිටුවහලක් අභ්‍යන්තර විගණන අංශය මගින් ලබා දීමට හැකි වුනි.

11. **භාණ්ඩ තොග පරීක්ෂණ :**

උතුරු / නැගෙනහිර පළාත් හැර, 2008 වර්ෂයට අදාල සියළු භාණ්ඩ තොග පරීක්ෂණ කටයුතු 2009 වර්ෂය තුලදී අවසන් කරන ලදී.

12. **දුම්කොළ බදු පනත සහ දුම්කොළ සහ මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කරන ලද ග්‍රහණ විස්තර “ එ ” සහ “ එ 2 ” පරිශිෂ්ඨයේ ඇත.**

13. **සුරාබදු හිඟ ආදායම් :**

2009 වර්ෂයේ අවසානය වන විට අයවීමට ඇති හිඟ සුරාබදු ආදායම් පිලිබඳ විස්තරයක් ඒ පරිශිෂ්ඨයේ ඇත. නියමිත වේලාවට සුරාබදු නොගෙවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතවී ඇත. මෙම බදු මුදල් එකතු කර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත

14. **විගණන විමසුම් :**

2009 වර්ෂය අදාලව විගණකාධිපති විසින් විගණන විමසුම් 10 ක් යොමු කර ඇති අතර, ඒ සියල්ලටම පිලිතුරු සපයා ඇත. මෙම විගණන විමසුම්වලට, පුහුණු වැඩ සටහන්, තැගි අරමුදල් ගිණුම, ආදායම් ගිණුම, රජයේ නිලධාරින්ගේ බී අත්තිකාරම් ගිණුම, සහ විසර්ජන ගිණුම පිලිබඳ කරුණු ඇතුලත් විය.

15. **දෙපාර්තමේන්තු වත්කම් :**

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා වත්කම් දැක්වෙන ලේඛණයක් " ඔ " පරිශිෂ්ඨයේ ඇත.

16. **අරමුදල් ගිණුම - ඕ පරිශිෂ්ඨය**

17. **අත්තිකාරම් ගිණුම - ක පරිශිෂ්ඨය**

18. **විසර්ජන ගිණුම - ග පරිශිෂ්ඨය**

19. **ආදායම් ගිණුම - ජ පරිශිෂ්ඨය**

20. **වර්ෂය තුලදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග:**

අ.

ර.බි 1	:	ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි ඒ	:	විදේශීය ස්ප්‍රීතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි බී	:	කිරි පොන්ස සහ/හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි සී	:	රා හැර, පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රීතුවලින් විදේශ ස්ප්‍රීතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය
ර.බි 3	:	තොග වෙළඳ බලපත්‍රය
ර.බි 4	:	සිල්ලරට විකුණුම් බලපත්‍රය
ර.බි 6	:	බියර් පෝටර් බලපත්‍රය
ර.බි 7	:	හෝටල් බලපත්‍රය
ර.බි 8	:	හෝටල් පීඨිකා බලපත්‍රය
ර.බි 9	:	විනෝද පීඨිකා බලපත්‍රය
ර.බි 10	:	දුම්රිය භෝජනාගාර බලපත්‍රය
ර.බි 11	:	ආපනාශාලා බලපත්‍රය
ර.බි 12	:	තානායම් බලපත්‍රය
ර.බි 13 ඒ	:	ක්‍රීඩා සමාජ / සමාජශාලා බලපත්‍රය
ර.බි 14	:	අවස්ථා බලපත්‍රය
ර.බි 15	:	විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය
ර.බි 16	:	වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය
ර.බි 17	:	පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය
ර.බි 18	:	ඖෂධීය වයින් බලපත්‍රය
ර.බි 19	:	විශේෂ බලපත්‍රය
ර.බි 22 ඒ	:	බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය
ර.බි 22 බී	:	බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය

ආ. නිෂ්පාදන බලපත්‍ර

පැසුනු, නොපැසුනු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ස්කාගාර බලපත්‍රය
- විනාකිරි බලපත්‍රය
- ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිලිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බලපත්‍රය

- එකතු කරන ස්ථාන බලපත්‍රය

ඇ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- පැසවූ මත්පැන්
- පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. කිතුල් ගස් පැසුණු රා නිශ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍ර

'ඒ' ශ්‍රේණියේ හෝටල්	(ර.බි 7)
	(ර.බි 8)
'බී' ශ්‍රේණියේ හෝටල්	(ර.බි 7)
	(ර.බි 8)
'සී' ශ්‍රේණියේ හෝටල්	(ර.බි 7)
	(ර.බි 8)
'ඒ ' ශ්‍රේණියේ ආපනශාලා	(ර.බි 11)
'බී' ශ්‍රේණියේ ආපනශාලා	(ර.බි 11)
'සී' ශ්‍රේණියේ ආපනශාලා	(ර.බි 11)

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බි 22 බී)

ඌ ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

21. **2009 වර්ෂයේ බලපත්‍ර දැරූ මත්පැන් නිෂ්පාදකයෝ**

1. සීමාසහිත ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම, අංක 324, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක.
2. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල
3. සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරී (ලංකා) සමාගම, මාවතගම
4. සමුපකාර ස්කාගාරය, පයාගල
5. ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, අංක 565, මිහිඳු මාවත, මාළඹේ
6. සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රි ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.
7. හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර
8. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් සමාගම, කොතලාවල, කඩුවෙල
9. සීමාසහිත ලයන් බෲවරී සමාගම, අංක 254, කොළඹ පාර, බියගම
10. සීමාසහිත මනෝරි ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල
11. සීමාසහිත මැකලම් බෲවරී (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ
12. සීමාසහිත නිපොන් එක්ස්පෝ කම්පැනි, අංක 102, ශාන්ත ඇන්ඩෲ පාර, මෝදර, කොළඹ 15.

13. සීමාසහිත පෙර්සිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5
14. සීමාසහිත රන්දිය මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත දන්කොටුව.
15. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල.
16. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 25/20, මහවත්ත පාර, එගොඩ උයන, මොරටුව
17. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ටිය, වාද්දුව
18. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, පස්සර පාර, විනීතගම, බදුල්ල.
19. තික්කම් ඩිස්ටිලරීස්, අල්වායි, පේදුරුතුඩුව
20. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, මිල්ලෑව, මොරගහහේන
21. වලිකාමම් ඩිස්ටිලරීස්, වංකානෙයි
22. සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම

22. නිශ්පාදිත මත්පැන් ප්‍රමාණයන්

අංක 1 වගුව : මොලැසස් අරක්කු

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ	23,055.370	13,806,092.70
සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම	1,201,097.330	719,000,465.98
සීමාසහිත මනෝර් ලංකා සමාගම	17,953.450	10,861,048.50
සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම	14,193.590	8,496,320.40
සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි	2,787.110	1,672,978.60
ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම	12,893.510	7,687,295.00
රන්දිය පුද්ගලික සමාගම	1,038.540	620,078.90
සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම	310,834.360	187,185,529.68
එකතුව	**1,583,853.260**	**949,329,809.76**

අංක 2 වගුව : පොල් සහ පදම් කල අරක්කු:

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
ඒ.ර.එෆ් (පුද්ගලික) සමාගම	1,271.270	775,474.700
සීමාසහිත ඇක්මී ලංකා සමාගම	9,762.530	5,774,623.60
සීමාසහිත පෙර්සිල් සමාගම	359,404.880	213,924,214.10
සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔප් ශ්‍රී ලංකා	1,895,440.150	1,132,863,217.50
හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ	16,145.080	9,790,920.80
සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම	443,623.010	264,471,621.14
සීමාසහිත මනෝර් ලංකා සමාගම	11,199.160	6,645,987.60
සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම	9,827.100	5,863,858.59
සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	1,539,759.840	907,086,703.10
ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	57,240.890	33,950,272.90
සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි	3,521.240	2,101,640.80
සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම	267,137.000	160,983,188.60
ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම	207.480	122,161.40
එකතුව	**4,614,539.630**	**2,744,353,884.83**

අංක 3 වගුව : විශේෂ අරක්කු

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම	134,297.230	80,312,175.80
සීමාසහිත ඇක්මී ලංකා සමාගම	422,604.770	253,094,240.60
සමුපකාර ස්කාගාරය	6,989.570	4,089,461.00
ක්ලැසික් නිශ්පාදකයෝ	23,189.370	14,055,897.80
සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔප් ශ්‍රී ලංකා	28,216,409.790	16,860,269,108.90
හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ	370,149.860	221,697,249.10
සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම	1,522,604.080	911,635,865.40
සීමාසහිත මනෝරි ලංකා සමාගම	78,713.250	47,121,224.00
සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම	131,396.410	78,573,876.58
සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	108,656.020	64,533,337.27
සීමාසහිත රන්දිය පුද්ගලික සමාගම	92,321.010	55,595,109.10
සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම	293,441.690	174,946,487.40
ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	65,295.150	39,064,509.00
සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම	1,079.550	642,280.50
සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි	97,096.370	58,253,208.60
සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම	248,998.290	148,960,140.12
එකතුව	**31,813,242.410**	**19,012,844,171.17**

23. දේශිය නිෂ්පාදිත විදේශිය මත්පැන්

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ	62,695.000	45,473,811.00
සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම	1,224,496.680	891,603,994.75
සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම	3,152.910	2,276,956.69
සීමාසහිත පෙර්සිල් පුද්ගලික සමාගම	783,131.600	567,428,821.00
සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	873,144.740	632,390,539.59
ඒ.ර්.එෆ් පුද්ගලික සමාගම	331.840	245,561.60
ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම	38,764.760	28,162,787.90
සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම	42,191.230	30,872,950.08
එකතුව	**3,027,908.760**	**2,198,455,422.61**

24. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් ලීටර	බදු මුදල (රු.ශත)
සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම	578,792.100	27,782,020.80
ලයන් බෲවරි සමාගම	11,777,866.660	565,337,599.68
මැකලම් බෲවරි සමාගම	490,845.330	23,560,575.60
එකතුව	12,847,504.090	616,680,196.08

25. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් ලීටර	බදු මුදල (රු.ශත)
සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම	7,065,484.800	452,191,027.20
ලයන් බෲවරි සමාගම	34,278,019.180	2,193,793,227.52
මැකලම් බෲවරි සමාගම	1,353,958.510	86,653,344.64
එකතුව	42,697,462.490	2,732,637,599.36

26. වයින්

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
හෝම් ඩිලයිට් වයින්	167.000	77,655.00
ලංකා වයින් පුද්ගලික සමාගම	5,830.192	2,623,340.28
එස්.ඩී.ටී වයින්	21.156	9,837.54
මිහිරි වයින්	118.500	12,367.76
මේෆල් වයින් මැනුෆැක්චරීස්	125.010	58,129.69
එකතුව	**6,261.858**	**2,781,330.27**

27. බෝතල් රා නිෂ්පාදකයෝ

බෝතල් ගත රා නිෂ්පාදකයන්ගේ නම් ද, නිෂ්පාදිත ප්‍රමාණයන් සහ අය කර ගන්නා ලද බදු මුදල් ද පහතින් දක්වා ඇත.

නිශ්පාදන ආයතනය	**ප්‍රමාණයන් (ලීටර)**	**බදු මුදල (රු.ශත)**
වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගරය	557,585.000	5,575,850.00
රිගල් බෝතල් රා නිෂ්පාදනාගාරය	474,195.000	4,741,950.00
එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය	2,275.000	22,750.00
ගෝල්ඩන් රිගල් කැමල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ	8,530.000	85,300.00
හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය	416,070.000	4,160,700.00
මනෝරි ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ	982,500.000	9,825,000.00
නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ	113,989.250	1,139,892.50
ෂුටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය	555,795.000	5,557,950.00
සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය	637,530.000	6,375,300.00
ඒ.එම්.පී බෝතල් රා නිෂ්පාදනාගාරය	323,929.375	3,239,293.75
ටී.එස්.ආර් බෝතල් රා නිෂ්පාදනාගාරය	883,530.000	8,835,300.00
නෙම්ටා බෝතල් රා නිෂ්පාදනාගාරය	33,215.000	332,150.00
නිව් ටී.එස්.ආර් බෝතල් රා නිශ්පාදනාගාරය	131,100.000	1,311,000.00
තෙල්ලිපලෙයි බෝතල් රා නිශ්පාදනාගාරය	15,127.500	151,275.00
අච්චුවේලි බෝතල් රා නිශ්පාදනාගාරය	8,500.000	85,000.00
මනිපායි බෝතල් රා නිශ්පාදනාගාරය	19,038.750	190,387.50
වංකානෙයි තල් සංවර්ධන සමුපකාරය	27,753.750	277,537.50
පේදුරුතුඩුව තල් සංවර්ධන සමුපකාරය	907.500	9,075.00
චාවකච්චේරි තල් සංවර්ධන සමුපකාරය	1750.000	17,500.00
පන්ඩතරිප්පු තල් සංවර්ධන සමුපකාරය	12,356.250	123,562.50
කමාන්ඩර් බෝතල් රා නිශ්පාදනාගාරය	101,040.000	1,010,400.00
එකතුව	**4,272,662.375**	**42,726,623.75**

28. ස්ප්‍රීතු

අංක 1 වගුව : පොල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු

ස්කාගාරය	**ශුද්ධ රා ලීටර**	**නිශ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර**
ඇක්මී ස්කාගාරය	275,571.200	20,006.300
බේරුවල ස්කාගාරය	11,414,836.500	852,009.300
සමුපකාර ස්කාගාරය	27,905.000	1,432.000
මෙස්ටිය ස්කාගාරය	3,020,751.000	243,163.200
වවුළුගල ස්කාගාරය	47,066.000	3,267.200
රොක්ලන්ඩ් ස්කාගාරය	6,284,195.000	465,536.000
සීදුව ස්කාගාරය	18,432,456.700	1,408,021.400
එකතුව	**39,502,781.400**	**2,993,435.400**

අංක 2 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණය

ස්කාගාරය	ශුද්ධ රා ලීටර	නිශ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර
තික්කම් ස්කාගාරය	643,320.000	28,179.500
වරණි ස්කාගාරය	132,525.000	6,555.300
වලිකාමම් ස්කාගාරය	915,564.250	39,798.100
එකතුව	1,691,409.250	74,532.900

අංක 3 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතුවලින් නිශ්පාදිත තල් අරක්කු ප්‍රමාණය

නිශ්පාදන ආයතනය	ප්‍රමාණයන් (ස.සැ.ලි)	බදු මුදල (රු.ශත)
තික්කම් නිශ්පාදනාගාරය	52,999.990	31,676,530.55
වරණි නිශ්පාදනාගාරය	8,607.700	5,088,322.19
වලිකාමම් නිශ්පාදනාගාරය	49,394.560	29,383,789.70
ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	680.400	401,814.00
එකතුව	111,682.650	66,550,456.44

29. පරිපාක ස්ප්‍රීතු නිශ්පාදනය

ස්කාගාරය	නිෂ්පාදන ප්‍රමාණය (සංශුද්ධ මධ්‍යසාර ලීටර)
පැල්වත්ත	5,288,459.700
සෙවනගල	3,755,963.000
එකතුව	9,044,422.700

30. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිශ්පාදනය සඳහා ආනයනය කරන ලද)

සමාගම	ආනයනය කල තොග ලීටර ප්‍රමාණය
සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා	11,479,377.000
සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම	991,926.000
සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම	501,300.000
සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම	98,288.000
හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම	92,000.000
එකතුව	13,162,891.000

31. කර්මාන්තශාලා නිශ්පාදනයන් සඳහා නිකුත් කල පරිපාක ස්ප්‍රීතු / කාර්මික ස්ප්‍රීතු / නිහඬ ස්ප්‍රීතු

ස්කාගාරය	පරිපාක ස්ප්‍රීතු ලීටර	කාර්මික ස්ප්‍රීතු ලීටර	නිහඬ ස්ප්‍රීතු ලීටර
හිඟුරාන ස්කාගාරය, කොරාඹේ	-	615,000.000	448,439.600
පැලවත්ත	1,677,447.800	1,279.800	-
සෙවනගල	1,115,384.700	-	-
එකතුව	2,792,832.500	616,279.800	448,439.600

32. ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු ප්‍රමාණය

2009 වසර තුල, ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු නිශ්පාදනයක්, පැලවත්ත සහ සෙවනගල සීනි ආයතයන්හි සිදු වී නොමැත.

33. විනාකිරි නිශ්පාදනය

බලපත්‍ර ලද ගස් ගණන, නිශ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

34. දුම්කොළ නිශ්පාදනය සහ බද්ද

2009 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාල බදු මුදල මෙසේ ය.

නිශ්පාදනය (කි.ග්‍රෑ)	බදු මුදල (රු.ශත)
2,059,445.600	20,594,456.00

35. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

අ. <u>කොළඹ ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධික්ෂණය යටතේ, සුරාබදු අධිකාරීවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් හත් දෙනෙකුගෙන් හා සෙසු නිලයන් විසි එක් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

සුරාබදු කොමසාරිස් ජනරාල්ට ලැබෙන මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා දිවයින පුරා සුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2009 වර්ෂය තුල මෙම ඒකකය මගින් සිදු කල අපරාධ ග්‍රහණ සංඛ්‍යාව 2060 කි. එය, විස්තරාත්මක වශයෙන් පහතින් දක්වා ඇත.

නීති විරෝධි ස්ප්‍රීතු පෙරීම්	131
නීති විරෝධි ස්ප්‍රීතු ලඟ තබා ගැනීම්	837
නීති විරෝධි ස්ප්‍රීතු විකිණීම හා ලඟ තබා ගැනීම්	431
නීති විරෝධි රා විකිණීම් හා ලඟ තබා ගැනීම්	46
නීති විරෝධි රා ලඟ තබා ගැනීම්	79
නීති විරෝධි රා විකිණීම්	63
අරක්කු ලඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත)	01
රජයේ අනුමත අරක්කු විකිණීම් (බලපත්‍ර රහිත)	310
නීති විරෝධි ලෙස ධාන්‍ය මත්පැන් හෙවත් බියර් විකිණීම	42
නීති විරෝධි ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම්	23
ගංජා ලඟ තබා ගැනීම්	65
ග්‍රහණය කරන ලද ගංජා හේන් ප්‍රමාණය	08
වෙනත් වැරදි	24
එකතුව	2060

2009 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 12,752,650/- කි. බලපත්‍ර ස්ථාන 602 ක් වටලන ලද අතර, ඒවායෙහි වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 18,166,138/- කි. ඒ අනුව, 2009 වසර තුල දී රජයට අයකර දුන් සමස්ථ අදායම රුපියල් 30,918,788/- කි.

2009 වර්ෂයේ දී මෙම ඒකකය විසින් හෙරොයින් ග්‍රෑම් 262 ක්ද, ගංජා කි.ග්‍රෑ 289 ක් අත්අඩංගුවට ගන්නා ලද අතර ඒ සම්බන්දයෙන් මහාධිකරණයේ නඩු 05 ක් ගොනු කර ඇත. තවද, කංසා හේන් අක්කර 34 1/2 ක් (ගංජා හේන් 06ක්) විනාශ කිරීමට සමත් වී ඇත.

ආ. <u>**මධ්‍යම පලාත් ඒකකය**</u>

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) අධීක්ෂණය යටතේ, සුරාබදු ස්ථානාධිපතිවරෙයක්, සුරාබදු පරීක්ෂකවරුන් හතර දෙනෙක්, සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු නියාමකවරුන් හත් දෙනෙක්, සුරාබදු කාන්තා නියාමකවරියක් හා සුරාබදු රියදුරෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටී. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය, දිවයින පුරාම විශේෂිත රාජකාරීවල නියුක්තව සිටී.

2009 වසරේදී සුරා වැටලීම් 1505 ක් සිදුකර පුද්ගලයින් 1505 ක් අත් අඩංගුවට ගෙන දඩ මුදල් ලෙස රුපියල් එක් කෝටි පණස්දෙදහස් එකසිය පණහක්(10,052,150/=) රජයට අයකර දී ඇති අතර, මේ සඳහා නීති විරෝධි ලෙස පෙරීම් මධ්‍යස්ථාන 142 ක් වටලන ලදී.

දිවයිනේ පලාත් 05 ක් තුල, බලපත්‍ර ස්ථාන 439 ක් කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර කාර්මික අපරාධ වාර්තා 439 ක් ඉදිරිපත් කර ඇත. මින් රුපියල් 9,843,925/= ක සමථ මුදලක් රජයට අයකර දීමට සමත් වී ඇත.

ඇ. **දකුණු පලාත් ඒකකය :**

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස්ගේ (දකුණු පළාත) අධීක්ෂණය යටතේ, ක්‍රියාත්මක වන මෙම ඒකකය සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙකු හා සුරාබදු නියාමකවරුන් 05 කුගෙන් සමන්විත විය. අදාල වර්ෂය තුල මෙම ඒකකය විසින් ග්‍රහණ 740 ක් සහ බලපත්‍ර කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා 37 ක් ඉදිරිපත් කර ඇත. උසාවි දඩ වශයෙන් රු:1,820 ,500/- ක් හා, කාර්මික අපරාධ වාර්තා සඳහා සමථ මුදල් වශයෙන් රු: 517,350/= ක් රජයට ලබා දී ඇත.

ඇ. **වයඹ පලාත් ඒකකය :**

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (වයඹ පළාත) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකය, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙක්, සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු කෝප්‍රල්වරයෙක් සහ සුරාබදු නියාමකවරුන් සතර දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සමන්විත ය. අදාල වර්ෂය තුල මෙම ඒකකය විසින්, ග්‍රහණ 841 ක් සිදුකර, අදාල වැරදි සම්බන්ධයෙන් පුද්ගලයන් 764 කට නඩු පවරා ඇත. උසාවි දඩ මුදල් වශයෙන් රු: 5,149,650/- ක මුදලක් අය ඇති අතර, අන්තරායකාරී ඖෂධ ආඥා පනත යටතේ, මි.ග්‍රෑ 70 ක හෙරොයින් ග්‍රහණ 01 ක් සිදු කර ඇති අතර, ඒ සඳහා රු:10,000/- ක දඩ මුදලක් අය කර ඇත.

36. **නිශ්පාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන් සහ ප්‍රගතිය**

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙක්, ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරයෙක්, කාන්තා සුරාබදු කෝප්‍රල්වරියක්, සහ සුරාබදු රියදුරුවරයෙක් අනුයුක්තව සිටී. මීට අමතරව, ඔරුගොඩවත්ත ශ්‍රේලයින් රේගු අංගනයේ ස්ප්‍රීතු ආනයනයට සම්බන්ධ සියළු කටයුතු කිරීම පිනිස, එක් සුරාබදු පරීක්ෂකවරයෙක් ද අනුයුක්ත කර ඇත.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියළුම ස්කාගාර, අරක්කු, බියර්, රා සහ වයින් නිශ්පාදනාගාරවල නිශ්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර ගැනීම සහ දිවයින පුරා පිහිටි අරක්කු හා රටබීම තොග වෙළඳ බලපත්‍ර (ර.බි 03) පරීක්ෂාව සහ එහි පවතින වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීමත් සහ නිරන්තර අධීක්ෂණයට එම බලපත්‍ර ස්ථාන ලක් කිරීමත් ය.

2009 වර්ෂය තුල ඉහත සඳහන් බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය කිරීම තුලින් පැවති වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා 138 ක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සමථ ගාස්තු වශයෙන් රුපියල් 5,295,500/- ක ආදායමක් රජයට ලබා දී ඇත. ඉලක්ක ගත කර ඇති සුරාබදු ආදායම ලඟා කර ගැනීම සඳහා මෙම ඒකකය විසින් මත්පැන් නිශ්පාදන ආයතන නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම තුලින් අපේක්ෂිත බදු ආදායම් ඉලක්කය සපුරා ගැනීමට දායක වී ඇත.

තවද, මත්පැන් නිශ්පාදනාගාර තොරතුරු සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාමත්, දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත නිශ්පාදනාගාර කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීමට දායකවීමත්, මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදු කරගෙන යනු ලබයි.

37. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ නීතිය බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මත්ද්‍රව්‍ය ඒකකය කොළඹ ඩී.ආර් විජේවර්ධන මාවතේ ක්‍රියාත්මක වේ. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු ඇතුළු නිලධාරීන් 20 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙම ඒකකය සමන්විත විය.

2009 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ග්‍රහණ 808 ක් සිදුකර ඇති අතර, ඒ මගින් මත්ද්‍රව්‍ය අපරාධකරුවන් ලෙස පිරිමි 730 ක් හා ගැහැණු 73 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ග්‍රහණ 808 න් 641 ක් හෙරොයින් සම්බන්ධ ඒවා වූ අතර,160 ක් ගංජා සම්බන්ධ ග්‍රහණ විය. ගංජා පැළ සාක්ෂි භාණ්ඩ වශයෙන් වන නඩු 23 ක් හා වෙනත් නඩු 09 ක් වූ අතර, සිද්ධීන් 83 ක් සම්බන්ධව මහාධිකරණයේ නඩු පවරා ඇත. දඩ මුදල් වශයෙන් රුපියල් 4,094,300/- ක් වශයෙන් අය කර ගෙන ඇත.

38. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුල දී, අපරාධ ග්‍රහණ 45737 ක් සිදු කර ඇති අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 196,313,030/= ක් අය කර ගෙන ඇත.

සුරා අපරාධ ග්‍රහණ 38965 ක්, මත් ද්‍රව්‍ය ග්‍රහණ 4280 ක් හා දුම්කොළ බදු පනත යටතේ ග්‍රහණ 1237 ක් ද, දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත යටතේ ග්‍රහණ 1255 ක් වශයෙන් ඉහත කී ග්‍රහණ 45737 ට ඇතුලත්ව ඇත.

39. පහරදීම් හා අවහිර කිරීම්

- කෑගල්ල සුරාබදු ස්ථානයට අනුයුක්ත කර සිටි සුරාබදු පරීක්ෂකවරයෙකුට ලැබුන ඔත්තුවකට අනුව, හෙරොයින් ළඟ තබා ගෙන සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට යාමේ දී ඇතිවූ පහරදීමක් හේතුවෙන් සුරාබදු පරීක්ෂකවරයාට සහ ඔහුට ඔත්තුව ලබා දුන් තැනැත්තාට රෝහල් ගත වීමට සිදු වුනි. මේ සම්බන්ධයෙන් අදාල චූදිතයාට එරෙහිව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර, එය වරෙන්තු නඩුවක් ලෙසින් පවති.

- රාජකාරියට බාධා කිරීම් පිලිබඳව සිද්ධීන 03 ක් අනුරාධපුර සුරාබදු ස්ථානයෙන් වාර්තා වී ඇති අතර, චූදිතයන්ට එරෙහිව අනුරාධපුර සහ කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, දැනට විභාග වෙමින් පවති.

සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද සුරාබදු ආදායම රුපියල් මිලියන 28,516 කි. මෙය 2008 වර්ෂයට වඩා 4% ක පමණ වර්ධනයකි. මත්පැන් පරිභෝජනයේ සිදු වී ඇති අඩුවීම ආදායම් වර්ධන වේගය අඩුවීමට හේතු වී ඇත. 2008 වර්ෂයට සාපේක්ෂව සැර මත්පැන් නිශ්පාදනයේ 10% ක පමණ අඩුවීමක් පෙන්නුම් කරන අතර, මෘදු මත්පැන් නිශ්පාදනය 3% ක පමණ අඩුවීමක් පෙන්නුම් කරයි. මත්පැන් නිශ්පාදනයේ අඩුවීමක් සිදු වුවද, බදු වැඩි කිරීම තුලින් 2008 වර්ෂයට වඩා සුරාබදු ආදායමේ සුළු වර්ධනයක් ලබා දී ඇත. මත්පැන් නිශ්පාදනයට අදාල සංඛ්‍යා ලේඛණ පිරික්සීමේ දී පසුගිය වර්ෂවල වසරින් වසර නිශ්පාදනයේ වැඩිවීමක් පෙන්නුම් කලත්, 2005 වර්ෂයෙන් පසු හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තීන් හේතුවෙන් 2008 වර්ෂයේ සිට මත්පැන් නිශ්පාදනයේ අඩුවීමක් නිරීක්ෂණය වේ. 2009 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 45737 කි. මෙම වැටලීම් සංඛ්‍යාව පසුගිය වසරට වඩා 19% ක පමණ අඩුවීමකි. මීට හේතු වූයේ, 2009 වර්ෂය තුලදී නීත්‍යානුකූල නොවන මත්පැන් තුරන් කිරීම සඳහා සමූහ ග්‍රහණ සංවිධානය කිරීම නිසා සංඛ්‍යාත්මක වශයෙන් වැටලීම් සංඛ්‍යාවේ අඩුවීමක් පෙන්නුම් කිරීමයි. නමුත්, ප්‍රමාණාත්මක ලෙස මෙම ග්‍රහණයන් වැඩි ගුණාත්මක භාවයකින් යුක්ත ය. මේ අනුව, සමාලෝචිත වර්ෂය තුලදී පවත්නා ප්‍රතිපත්ති රාමුව තුල දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමි.

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වය සලසා දීමෙන් මාගේ ක්‍රියාකාරිත්වයට ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපති තුමාටත්, මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙවීමෙන් හා නිරන්තර ප්‍රගති සමාලෝචනය තුලින් මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණ හා නිරන්තර උපදෙස් ලබා දීමෙන් බාධක මග හරවා ගැනීමට දායකවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහය දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ සියළුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුන සහය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සමීපව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහය දැක්වූ ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කර සිටිමි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා පුහුණු අවස්ථා සලසා දීමෙන් දායක වූ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය,රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය, මානව හිමිකම් කොමිසම, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් කමිටුව සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය යනාදී ආයතනයන්ට ද මාගේ කෘතඥතාවය හිමිවේ.

එමෙන්ම, ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදන සපයන මූල්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන විසින් මෙම දෙපාර්තමේන්තුවට විදේශ පුහුණු අවස්ථා ලබා දීමෙන් දක්වන ලද අනගි සහයට විශේෂයෙන් ස්තුතිය පිරිනමමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

(වසන්ත හපුආරච්චි)
සුරාබදු කොමසාරිස් ජනරාල්